# වාර්ෂික වාර්තාව 2021

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්
ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

# පටුන

**පිටු අංක**


01. හැඳින්වීම 03

02. සභාපතිතුමාගේ/අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩ 04

03.අධිකාරියේ දැක්ම සහ මෙහෙවර 05

04. අධිකාරියේ අරමුණු සහ කාර්යයන් 06-07

05.ආයතනයේ සංවිධාන ව්‍යුහය සහ කාර්යය මණ්ඩලය 08-12

06. කාර්යය සාධනය

**6.1 නීති හා නීති බලාත්මක කිරීමේ අංශය 13-16**

**6.2 රැකවරණ අංශය 17-18**

**6.3 ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය 19-24**

**6.4 පාලන හා කළමනාකරණ අංශය 25-26**

**6.5 මූල්‍ය අංශය 27**

07. විගණන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනය 28-53

08. කාර්යසාධනය වර්ධනයට අදාල අර්ධකාලීන/කෙටිකාලීන සැලසුම් 54-55

# 01.හැඳින්වීම

වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද, 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. මෙම අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වී ඇත්තේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය, ආරක්ෂා කිරීම සහ බලාත්මක කිරීම වේ.ඊට අතිරේකව අපරාධ වින්දිතයන්හට සිදුවන කායික සහ මානසික හානි වෙනුවෙන් වන්දි ලබා දීම සඳහා අවශ්‍ය ආරක්ෂණ අරමුදල් පවත්වා ගැනීම සේම අපරාධ වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට අවශ්‍ය ආරක්ෂාව සැලසීම සහ වෙනත් සහනයන් ලබා දීම මෙන්ම අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුවන වැරදි විමර්ශනය කිරීම හා ඊට අදාල දණ්ඩන නියම කිරීමත් මෙම අධිකාරිය මඟින් ඉටු කරනු ලැබේ.

ඒ අනුව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනයන් සිදු කිරීමත්, අදාල පැමිණිලි අවශ්‍ය පරිදි කළමණාකරණ මණ්ඩලය විසින් පත් කරන මූල මණ්ඩලයකට යොමු කොට එකී මූල මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ද සිදුවේ.එසේම අපරාධ වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා ලැබෙන ඉල්ලීම් අධිකාරියට සම්බන්ධ පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසයට යොමු කර තර්ජන තක්සේරු සිදු කිරීමෙන් අනතුරුව එකී තර්ජනයේ ස්වභාවය අනුව වින්දිතයාට හා සාක්ෂිකරුට ආරක්ෂාව ලබා දීම සිදු කෙරේ.එමෙන්ම අධිකරණ කටයුතුවලට සහභාගී වීමේ දී වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීම ද ඊට අතිරේකව සමකාලීන ශ්‍රව්‍ය- දෘශ්‍ය තාක්ෂණය මගින් ආරක්ෂිත ස්ථානයන්හි සිට සාක්ෂි ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය ද මෙම අධිකාරිය විසින් සිදුකරනු ලැබේ.

ඒ අනුව 2021 වර්ෂය වන විට විමර්ශනය වෙමින් පැවති පැමිණිලි 395 ට අමතරව 2021 වර්ෂය තුළ අධිකාරිය වෙත මහජනතාවගෙන් හා විවිධ ආයතන වෙතින් පැමිණිලි 160ක් ලැබී ඇති අතර, එම සමස්ත පැමිණිලි අතුරින් ආරක්ෂාව සඳහා ඇති ඉල්ලීම් විමර්ශනය කර 56 දෙනෙකු සඳහා ආරක්ෂාව ලබා දී ඇති අතර, විමර්ශන කටයුතු අවසන් කරන තෙක් 83 දෙනෙකු සඳහා අන්තර් ආරක්ෂාව ලබා දී ඇත.එමෙන්ම අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් සඳහා ඇති ඉල්ලීම් 147 අතුරින් 48 ප්‍රමාණයක් අවසන් කිරීමට 2021 වර්ෂය තුළ හැකි වී ඇත. කෙසේ වුවද මෙම පැමිණිලිවලට අදාල සිද්ධිවල ස්වභාවය අනුව හා අධිකරණ ක්‍රියාමාර්ග අවසන් නොවී පැවතීම වැනි සාධක මත මෙම පැමිණිලි අවසන් කිරීමට ගත වන කාලය වෙනස් විය හැකිය.

මීට අමතරව 2021 වර්ෂයේ සමකාලීන ශ්‍රව්‍ය - දෘශ්‍ය සම්බන්ධක උපයෝගී කරගෙන ආරක්ෂිතව සාක්ෂි ලබා ගැනීමේ කටයුතු, වින්දිත බලපෑම් ප්‍රකාශ ගොනු කිරීම මගින් වින්දිතයන් වෙත වන වියදම් පියවා දීම ද සිදුකර ඇත.එසේම වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ කටයුතු ද මෙම වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව 2021 වර්ෂයේ මෙම අධිකාරිය විසින් ලඟා කර ගෙන ඇති කාර්යය සාධනය මෙම වාර්තාවේ අන්තර්ගත කොට ඇත.

# 02.සභාපතිතුමාගේ/අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩ

## 01.සභාපතිතුමාගේ පණිවුඩය



2021 වසර දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ පරමාර්ථ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරමින්, ආයතනයේ කාර්යයභාරය විධිමත් සැලස්මකට අනුව කරගෙන යමින්, රටේ මහජනතාවට සේවය කිරීමට ලැබීම ගැන මෙන්ම මෙම ආයතනය මෙතෙක් ආ ගමන්මග පිළිබඳව මම උදක්ම සතුටු වෙමි. මෙහි දී විශේෂයෙන්ම කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් ලැබුණු සහයෝගය මෙන්ම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුලු කාර්යය මණ්ඩලයේ කැපවීම ඉතාමත්ම ඉහලින් අගය කරමි. මෙම විෂය පථයට අදාල අන්තර්ජාතික මට්ටමේ නව සේවාවන් පුළුල් කරමින් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට ඉදිරියටත් අප ආයතනයෙන් සුවිශේෂී සේවාවන් රාශියක් ලබාදීමට අප දැනටමත් පිඹුරුපත් සකස් කර ඇති අතර, ඒවා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවිඩය ගෙන ඒමට ලැබීම ඉමහත් සතුටකි.

සුහද කේ. ගමලත්
සභාපති

## 02.අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය මඟින් 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහායදීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා, සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ඒ අනුව 2021 වර්ෂය තුල දී අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගෙන් අධිකාරියට ලැබුණු පැමිණිලි විමර්ශනය කර ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව හා වෙනත් සහායන් ලබාදීම සිදු කරන ලද අතර, මේ සම්බන්ධව රජයේ නිලධාරීන් හා මහජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම අධිකාරියේ විශේෂ අවශ්‍යතාවයක්ව පැවති රැකවරණ නිවාසයක් සපයාගැනීමේ කාර්යය මෙම වර්ෂය තුළ දී ඉටු කිරීමට හැකි වීම විශේෂ ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය. එසේම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් අවසන් කාර්තුවේ දී මා සේවයට වාර්තා කල ද, ඊට පෙර මෙම කටයුතු සඳහා හිටපු අධ්‍යක්ෂ ජනරාල් උදයකුමාර අමරසිංහ මහතාගේ සේවය ද සිහිගන්වන අතර, මෙම අධිකාරියේ කටයුතු නියමිත ඉලක්ක කරා ගෙන යාම සඳහා මඟ පෙන්වන ලද සභාපතිතුමා ඇතුලු කළමනාකරණ මණ්ඩලයට, පොලිස් ආරක්ෂක කොට්ඨාශයට, අධිකාරියේ කාර්යය මණ්ඩලයට ද මාගේ ස්තුතිය පුද කරන අතර, මෙම කටයුතු සඳහා නිරන්තර අධීක්ෂණයෙන් සහාය වූ අධිකරණ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුලු කාර්යය මණ්ඩලයටද මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරමි.

බී.කේ.එස්.රවීන්ද්‍ර
අධ්‍යක්ෂ ජනරාල්

# 03.අධිකාරියේ දැක්ම - මෙහෙවර

✓ <u>දැක්ම</u>

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක්

✓ <u>මෙහෙවර</u>

අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම, බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම

# 04.අධිකාරියේ අරමුණු සහ කාර්යයන්

## 4.1 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ අරමුණු

1. අපරාධ වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය කිරීම හා අදාල පැමිණිලි විමර්ශනය කොට එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම හා අදාල පැමිණිලි විමර්ශනය කොට එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
3. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට අවශ්‍ය සහායයන් සැපයීම හා ආරක්ෂාව ලබාදීමට කටයුතු කිරීම.
4. අපරාධ වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සංවේදීකරණය කිරීම.
5. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුවන වැරදි සම්බන්ධව නීති මගින් කටයුතු කිරීම.
6. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් සඳහා වන්දි ලබාදීමේ අරමුදල පවත්වාගෙන යාම සහ යෙදවීම.
7. අපරාධ අඩු කිරීම හා ඒ සඳහා පර්යේෂණ පැවැත්වීම.
8. අපරාධ සම්බන්ධ දඬුවම් නියම කිරීම සඳහා විකල්පයක් වශයෙන් වින්දිතයන් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය පියවර වර්ධනය කිරීම හා ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 4.2 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ කාර්යය සහ කර්තව්‍යයන්

1. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම්, හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
3. අපරාධයක වින්දිතයන්ගේ හෝ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හෝ හිමිකම් කඩවීම සම්බන්ධ ලැබෙන පැමිණිලි විභාග කොට ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
4. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනුරුත්ථාපනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
5. අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට වන්දි ප්‍රදානය කිරීම.
6. මෙම පනත මගින් දක්වා ඇති අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.
7. අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැපයීම , අවශ්‍ය ප්‍රතිකාර, පුනුරුත්ථාපන හා උපදේශනය ඇතුලු සහායන් සැපයීම සඳහා සියලුදෙනා දැනුවත් කිරීම.
8. අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් පුනුරුත්ථාපනය කිරීමට අදාළව අනෙකුත් ආයතනවල ප්‍රතිපත්ති හා අනෙකුත් පටිපාටින් සංශෝධන සඳහා නිර්දේශ ලබාදීම.
9. සෑම අධිකාරියකින් හෝ කොමිෂන් සභාවකින් හෝ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධිකරණ පද්ධතිය ඔස්සේ සාක්ෂි ලබාගැනීමේ නිදහස හා සහාය සැපයීම පිළිබඳ තොරතුරු ලබාදීම.
10. යම් අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් හෝ වෙනයම් තැනැත්තකුගේ ඉල්ලීම මත සමකාලීන ශ්‍රව්‍ය- දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ සාක්ෂි ලබා ගැනීම සඳහා පිළිගත් ප්‍රතිමානවලට අනුකූලව පහසුකම් සැපයීම.
11. අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට වයස, ස්ත්‍රී පුරුෂභාවය, අබාධිතබව හෝ වෙනත් විශේෂ අවශ්‍යතාවය මත සිදු විය හැකි හානි පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සහ අපරාධ සිදුවීම අඩු කළ හැකි ක්‍රම සහ ඒ සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම.
12. දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන් අපරාධ වින්දිතයන් පෙර සිටි තත්ත්වයට ගැනීමේ පියවර වර්ධනය කිරීම හා ඊට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම.
13. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම, යොදා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
14. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ සහායක කොට්ඨාසය පවත්වාගෙන යාම හා නියමු උපදේශ නිකුත් කිරීම

# 05.ආයතනයේ සංවිධාන ව්‍යුහය සහ කාර්යය මණ්ඩලය

## 5.1 <u>අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය</u>

**පනත ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කළ සාමාජිකයින් :-**

1. සභාපති : - ජනාධිපති නීතිඥ සුහද කේ.ගමලත් මහතා
   විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. උදයකුමාර අමරසිංහ මහතා
   අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
   ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



3. වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා
   ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී



4. වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහතා
   විශේෂඥ මනෝ වෛද්‍ය නිලධාරී



5. නීතිඥ සමන් සේනාධීර මහතා



**නිල බලයෙන් පත්වූ සාමාජිකයින්: -**

1. ජනාධිපති නීතිඥ සුසන්ත බාලපටබැදි මහතා
   අතිරේක සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව



2. එල්. එස්. පතිනායක මහතා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
   අපරාධ, සංවිධානාත්මක අපරාධ, ළමුන් සහ කාන්තා අපයෝජන
   වැළැක්වීමේ කාර්යාංශය, මත්ද්‍රව්‍ය සහ මැතිවරණ පරාසය
   පොලිස් මූලස්ථානය



3. නිමල් කරුණාසිරි මහතා

කොමසාරිස්

මානව හිමිකම් කොමිෂන් සභාව



4. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය

අතිරේක ලේකම් (නීති)

අධිකරණ අමාත්‍යාංශය



5. එන්. එච්. එම්. ඩබ්ලිව්. එන්. හේරත් කුමාරි මහත්මිය

අතිරේක ලේකම් (සංවර්ධන)

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය



6. එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය

අතිරේක ලේකම් (නීතිය හා සාමය) (වැඩ බලන)

ආරක්ෂක අමාත්‍යාංශය



නිරීක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)

එස්. ඒ. සී. කුලතිලක මහත්මිය,

අධ්‍යක්ෂ ජනරාල්, කලමණාකරන විගනණ දෙපර්තුමෙන්තුව,

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය

## 5.2 2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

1. එස්. ඒ. සී. කුලතිලක මහත්මිය - සභාපති

   අධ්‍යක්ෂ ජනරාල්,

   කලමණාකරන විගණන දෙපාර්තුමෙන්තුව,

   මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය

2. පියුමන්ති පීරිස් මිය - සාමාජික

   අතිරේක ලේකම්

   අධිකරණ අමාත්‍යාංශය

3. එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය - සාමාජික

   අතිරේක ලේකම් (නීතිය හා සාමය) (වැඩ බලන),

   ආරක්ෂක අමාත්‍යාංශය

4. නීතිඥ සමන් සේනාධීර මහතා - සාමාජික

5. සුජීවා පෙරේරා මහත්මිය - නියෝජිත

   ජාතික විගණන කාර්යාලය

6. චම්පා බාලසූරිය - නිරීක්ෂක

   අධිකරණ අමාත්‍යාංශය

## 5.3 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය කාර්යය මණ්ඩල සාරාංශය -2021/12/31 දිනට

| වර්ගය | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ***ජ්‍යෙෂ්ඨ මට්ටම*** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | HM 2-3 | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ | HM 1-3 | 6 | 4 | 2 |
| සහකාර අධ්‍යක්ෂ | MM 1-3 | 3 | 3 | 0 |
| කළමනාකරණ මණ්ඩල ලේකම් | MM 1-3 | 1 | 1 | 0 |
| ***තෘතීය මට්ටම*** | | | | |
| නීති නිලධාරී | JM 1-1 | 3 | 2 | 1 |
| අභ්‍යන්තර විගණන නිලධාරී | JM 1-1 | 1 | 1 | 0 |
| විමර්ශන නිලධාරී | MA 4 | 6 | 5 | 1 |
| රැකවරණ නිලධාරී | MA 4 | 10 | 0 | 10 |
| සන්නිවේදන නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| තොරතුරු නිලධාරී | MA 4 | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | MA 4 | 1 | 1 | 0 |
| ***ද්විතීය මට්ටම*** | | | | |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | 10 | 6 | 4 |
| ***ප්‍රාථමික මට්ටම*** | | | | |
| රියදුරු | PL 3 | 6 | 6 | 0 |
| කාර්යාල කාර්ය සහායක | PL 1 | 6 | 5 | 1 |
| **එකතුව** | | **56** | **36** | **20** |

-වගුව 01-

## 5.4 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ -සංවිධාන ව්‍යුහය-



# 06.කාර්යය සාධනය

## 6.1 නීති හා නීති බලාත්මක කිරීමේ අංශය

අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකමක්/හිමිකමක් කඩවීමක් හෝ අත්‍යාසන්න කඩවීමක් පිළිබඳව ලැබුනු යම් පැමිණිල්ලක්/තොරතුරක් මත 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය සහ සහතික කිරීම උදෙසා කරන ලදැයි කියන කඩකිරීම පිළිබඳව විමර්ශනය කිරීම සහ අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම නීති හා නීති බලාත්මක කිරීමේ අංශය මගින් සිදුකරයි.

2021 වසරේ ජනවාරි මස 01 වන දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය වෙත මහජනතාව හා රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද සමස්ත පැමිණිලි ගණන 160ක් වේ.

### 6.1.1 -2021 වර්ෂයේ පැමිණිලි ලැබීම - භූගෝලීය ප්‍රදේශ අනුව:

| පළාත | සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 77 |
| දකුණ | 17 |
| මධ්‍යම | 16 |
| උතුරු මැද | 15 |
| වයඹ | 11 |
| සබරගමුව | 11 |
| නැගෙනහිර | 08 |
| ඌව | 05 |
| **එකතුව** | **160** |

-වගුව 02-




-ප්‍රස්ථාර 01-

## 6.1.2 - පැමිණිලි වර්ගීකරණය:

අධිකාරියට කරනු ලබන පැමිණිලි, 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි 3,4 වගන්තිවලට අනුව වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම්/හිමිකම් කඩවීම සම්බන්ධයෙන් සහ 8,9 වගන්ති යටතේ වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව වන වැරදි ලෙස, පැමිණිලි[1] ස්වභාවය අනුව පහත පරිදි වර්ග කරනු ලැබේ.

**i. ආරක්ෂාව සඳහා වන ඉල්ලීම්**

**ii. අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම්**

**iii. වැරදි විමර්ශනය**

**iv. සහාය ඉල්ලීම්**

**v. වෙනත්**

| ඉල්ලීම් ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| 01.ආරක්ෂාවසඳහා වන ඉල්ලීම් | 79 |
| 02.අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් | 40 |
| 03.වැරදි විමර්ශනය | 36 |
| 04.සහාය ඉල්ලීම් | 13 |
| 05.වෙනත් | 40 |
| **එකතුව** | **208** |

-වගුව 03-




-ප්‍රස්ථාර 02-

[1] සැ.යු.: එක් පැමිණිල්ලක ඉල්ලීම් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඇතුලත් වේ.

## i.අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම්:

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි 3,4 වගන්ති යටතේ වන අයිතිවාසිකම් සහ හිමිකම් කඩවීම සම්බන්ධයෙන් සිදුකරනු ලබන ඉල්ලීම් විමර්ශනය කිරීමයි.

| | |
|---|---|
| 2020 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ඉල්ලීම් ගණන | 107 |
| 2021 වර්ෂය තුළ ලැබී ඇති ඉල්ලීම් ගණන | 40 |
| **එකතුව** | 147 |
| විමර්ශන අවසන් කරන ලද ඉල්ලීම් ගණන | 48 |
| තවදුරටත් විමර්ශනය වෙමින් පවතින ඉල්ලීම් ගණන | 99 |

-වගුව 4-

## ii.වැරදි විමර්ශනය:

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි 8,9 වගන්ති යටතේ දක්වා ඇති වරදවල් සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් විමර්ශනය කිරීමයි.

| | |
|---|---|
| 2020 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ඉල්ලීම් ගණන | 74 |
| 2021 වර්ෂය තුළ ලැබී ඇති ඉල්ලීම් ගණන | 36 |
| **එකතුව** | 110 |
| විමර්ශන අවසන් කරන ලද ඉල්ලීම් ගණන | 40 |
| තවදුරටත් විමර්ශනය වෙමින් පවතින ඉල්ලීම් ගණන | 70 |

-වගුව 05-

## iii.සහාය ඉල්ලීම්:

අපරාධයක වින්දිතයකු වීම හේතුවෙන් විදින ලද යම් හානියක් අලාභයක් හෝ පාඩුවක් සඳහා හානිපූරණය සහ ප්‍රතිෂ්ඨාපනය ඇතුලු සුදුසු සහ සාධාරණ සහනයන් ලබා දීමයි.

| | |
|---|---|
| 2020 වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ඉල්ලීම් ගණන | 44 |
| 2021 වර්ෂය තුළ ලැබී ඇති ඉල්ලීම් ගණන | 13 |
| **එකතුව** | 57 |
| විමර්ශන අවසන් කරන ලද ඉල්ලීම් ගණන | 06 |
| තවදුරටත් විමර්ශනය වෙමින් පවතින ඉල්ලීම් ගණන | 51 |

-වගුව 6-

කෙසේ වුවද 2021 වර්ෂය ආරම්භ වන විට නීති හා නීති බලාත්මක කිරීමේ අංශය විසින් විමර්ශනය කිරීමට ඉතිරිව තිබූ ඉල්ලීම් සංඛ්‍යාව 267ක් වන අතර 2021.12.31 දක්වා අධිකාරියට ලැබුණු පැමිණිලි ද ඇතුලත්ව නීති හා නීති බලාත්මක කිරීමේ අංශය මගින් විමර්ශනය කරන ලද මුළු ඉල්ලීම් සංඛ්‍යාව 396 කි. ඒ අතරින් 2021.12.31 වන විට විමර්ශනය අවසන් කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව 134කි.

### 6.1.3 - සමකාලීන ශ්‍රව්‍ය -දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි ලබා දීම:

යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව පිළිබඳ බියක් හෝ වෙනත් සාධාරණ හේතුවක් මත අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට අපහසු අවස්ථාවක දී ශ්‍රී ලංකාවෙන් පිටත හෝ ශ්‍රී ලංකාව තුළ, අධිකරණයෙන් පිටත වෙනත් ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය - දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි ලබා ගැනීමට 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව හිමිකමක් ඇත.ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම අධිකාරියේ නීති අංශය මගින් සිදුකරනු ලබයි.

2021 වර්ෂය තුළ දී පහත සඳහන් නඩු කටයුතු සඳහා නීති අංශය මගින් සමකාලීන ශ්‍රව්‍ය -දෘශ්‍ය සම්බන්ධක ඔස්සේ සාක්ෂි මෙහෙයවීමට අවශ්‍ය සහාය සපයා ඇත. එලෙස සමකාලීන ශ්‍රව්‍ය -දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි ලබා දුන් නඩු කටයුතු සංඛ්‍යාව - 03 කි.

| පැමිණිලි අංකය | ස්ථානය | සහාය සැපයූ දින ගණන |
|---|---|---|
| HC/SP1/20/2018 | කොළඹ මහාධිකරණය | 02 |
| HC/4/20/20/18 | කුලියාපිටිය මහාධිකරණය | 01 |
| HC/553/18 | කොළඹ මහාධිකරණය | 05 |

-වගුව 7-

# 6.2 රැකවරණ අංශය

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට ආරක්ෂාව ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි. ඒ අනුව ආරක්ෂාව ලබා ගැනීම සම්බන්ධයෙන් වන ඉල්ලීම් දෙයාකාරයකින් රැකවරණ අංශය වෙත ලැබේ.

1. **පනතේ 21 වගන්තිය ප්‍රකාරව ආරක්ෂාව ලබා ගැනීම සඳහා අධිකාරිය වෙත යොමු කරනු ලබන පැමිණිලි**
2. **පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව අධිකරණ සහ කොමිෂන් සභා වලින් යොමු කරනු ලබන නියෝග.**

ආරක්ෂාව ලබා ගැනීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් හෝ අධිකරණ හෝ කොමිෂන් සභා නියෝගයක් රැකවරණ අංශය වෙත ලැබු පසු අදාල අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරු හට තර්ජනයක් පවතින්නේද යන්න සම්බන්ධයෙන් අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨසය මගින් තර්ජන තක්සේරු වාර්තා කැඳවා ගැනීමට රැකවරණ අංශය විසින් කටයුතු කරනු ලැබේ. අදාල තර්ජන තක්සේරු වාර්තාවන් අනුව අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරුට පවතින තර්ජනයේ ස්වභාවය සහ ප්‍රමාණ සලකා බැලීමෙන් අනතුරුව අවශ්‍ය ආරක්ෂාව ලබා දීමට කටයුතු කරයි. තර්ජන තක්සේරු වාර්තා ලැබෙන තෙක් අදාල අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට අන්තර් ආරක්ෂාවක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

### 6.2.1- පැමිණිලි සම්බන්ධයෙන් වන ප්‍රගතිය; ආරක්ෂාව සඳහා වන ඉල්ලීම්:

| වර්ෂය | පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සහ අන්තර් ආරක්ෂාවක් ලබා දෙමින් පවතින පැමිණිලි | ආරක්ෂාව ලබා දෙමින් පවතින පැමිණිලි | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | බහා තබන ලද පැමිණිලි | නීතිපති උපදෙස් සඳහා යොමු කරන ලද පැමිණිලි |
|---|---|---|---|---|---|---|
| පෙර වර්ෂ වලින් ඉදිරියට ගෙන එන ලද පැමිණිලි | 128 | 36 | 48 | 28 | 15 | 01 |
| 2021 | 79 | 47 | 08 | 20 | 04 | - |
| **එකතුව** | **207** | **83** | **56** | **48** | **19** | **01** |

-වගුව 8-

### 6.2.2 අධිකරණ සහ කොමිෂන් සභා නියෝගවලට අදාලව ගෙන ඇති ක්‍රියාමාර්ග:

| වර්ෂය | අධිකරණ සහ කොමිෂන් සභා නියෝග ගණන | විමර්ශනය වෙමින් පවතින සහ අන්තර් ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග | ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග | බහා ලබන ලද නියෝග | අවසන් කරන ලද නියෝග |
|---|---|---|---|---|---|
| පෙර වර්ෂවලින් ඉදිරියට ගෙනා නියෝග | 55 | 03 | 17 | 31 | 04 |
| 2021 | 12 | 03 | 03 | 06 | - |
| **එකතුව** | **67** | **06** | **20** | **37** | **04** |

-වගුව 9-

තවද, 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තකට සහභාගී වීම සඳහා අධිකරණය වෙත යාමේදී ආහාර නවාතැන් සහ ප්‍රවාහනය වෙනුවෙන් මුදල් ගෙවන ලෙස අධිකරණයකින් නියෝගයක් ලද විට උපරිමය රුපියල් පන්දහසකට යටත්ව ගෙවන ලෙස 2019.11.15 වන දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදි. 2020 වර්ෂයේදී ලැබුණු එවැනි නියෝග දෙකක් වෙනුවෙන් 2021 වර්ෂය සඳහාද මුදල් ගෙවන ලදි.

# 6.3 ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි (13) වන වගන්තිය ප්‍රකාරව ප්‍රතිපත්ති සහ වැඩසටහන් අංශයේ කාර්යයභාරය ලෙස,අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව මහජනයා දැනුවත්කිරීම, පරිවාස සහ සමාජ සේවා සමග සම්බන්ධ රජයේ වෛද්‍ය නිලධාරීන්, රාජ්‍ය සේවකයන්,බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසියේ ආදී වූ නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් සංවේදනය කිරීම, අපරාධ සිදුවීම අඩුකළ හැකි ක්‍රම සහ විධි පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, සහ ප්‍රතිපත්ති, නීති, ක්‍රියාමාර්ග සහ ක්‍රියාපටිපාටි අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අදාළව සමාලෝචනය කිරීම හා සුදුසු ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියා මාර්ග පිළිගැනීම, සංශෝධනය කිරීම සහ යොදා ගැනීම ආදිය වේ. ඒ අනුව මෙම අංශය ප්‍රතිපත්ති සහ වැඩසටහන් යන කොටස් දෙකෙහිම කාර්යයන් 2021 වර්ෂයේ පහත පරිදි කිරීමට හැකි විය.

### 6.3.1 - 2021-2023 වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීම හා ඒ අනුව වැඩ කටයුතු කරගෙන යාම ආරම්භ කිරීම:

අධිකාරියේ සේවාවන් මහජනයා වෙත වඩාත් පුළුල් ලෙස ගෙන යාමේ අදිටනින් යුතුව සකස් කරන ලද 2021-2023 වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්ම ගරු අධිකරණ ඇමතිතුමාට ඉදිරිපත් කිරීම අමාත්‍යාංශයේදී සිදු කල අතර ඒ අනුව අධිකාරියේ 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඉදිරියට එහි ඇති කාර්යයන් කරගෙන යන ලදී.

### 6.3.2 - දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම:

<u>වැඩසටහන I</u>

**බස්නාහිර පළාතේ උසස් පොලිස් නිලධාරීන් 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පිළිබඳව දැනුවත් කිරීම.**

**අරමුණ-** යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගන්වමින්, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි සමාජ වගකීමක් - කාර්යභාරයක් පැවරෙන සහ වඩාත් අවධානය යොමු කළ යුතු පළාතක් වන බස්නාහිර පළාතේ උසස් පොලිස් නිලධාරීන් යුක්තිය පසදලීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා "වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ආරක්ෂා කිරීමේ වැදගත්කම" යන මැයෙන් 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පිළිබඳව දැනුවත් කිරීම.

**දිනය/ස්ථානය -** 2021 මාර්තු මස 17 වන දින කොළඹ දිසාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්‍යාලීය ශ්‍රවනාගාරය

**සහභාගීත්වය -** සමාරම්භක උළෙල අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්‍රි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි.

බස්නාහිර පලාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු, අධ්‍යක්ෂවරු සහ ස්ථානභාර නිලධාරි මහතුන් 35ක් සහභාගී විය.

අධිකාරියේ කළමණාකරන මණ්ඩලයේ සාමාජිකයින්ගේ සම්පත් දායකත්වයෙන් තාක්ෂණික සැසි වාර පැවැත්විය.

අධිකාරිය සඳහා නිර්මාණය කරන ලද අභිනව වෙබ් අඩවිය විවෘත කිරීම ද සිදු විය.






## වැඩසටහන II

**වෙබිනා (webinar) නියමු ව්‍යාපෘතිය**

**අරමුණ-** 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පිළිබඳව දැනුවත් කිරීම.

**දිනය/ස්ථානය -** 2021 අගෝස්තු මස 18 වන දින දුරස්ත මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී.

**සහභාගීත්වය -** පොලිස්, ළමා ආරක්ෂණ, ළමා හිමිකම් ප්‍රවර්ධන සහ පරිවාස නිලධාරීන් 32 ගේ සහාභාගිත්වයෙන් පවත්වන ලදී.
අධිකාරියේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් දේශන පවත්වන ලදී.






## වැඩසටහන III

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම උදෙසා දකුණු පලාත් පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම**

**අරමුණ-** නීතිය බලාත්මක කරමින් අපරාධ අවම කිරීමටත්, අපරාධ අවම කළ හැකි ක්‍රම සහ විධි පිළිබඳව පොලිස් නිලධාරීන් සංවේදනය කරමින්, අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනයට සහ ආරක්ෂා කිරීමට අදාලව ගත හැකි නීති සහ ක්‍රියා මාර්ග පිළිබඳව 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත තුළින් දැනුවත් කිරීම.

**දිනය/ස්ථානය** - 2021 දෙසැම්බර් 2 සහ 3 දිනයන්හිදී ගාල්ල අමාරි හෝටලයේදී (UNDP ආයතනයේ ආධාර ඇතිව පවත්වන ලදී.)

**සහභාගීත්වය** - දකුණු පලාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු, ස්ථානභාර නිලධාරි මහතුන් සහ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරුන් 75 දෙනෙකු සහාභාගි විය.









## 6.3.5 -පාසැල්, පොලිස් ස්ථාන, රෝහල් පරිශ්‍රයන් වලට පොස්ටර් බෙදා හැරීම හා ප්‍රදර්ශනය කිරීම:

- උතුරු පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂක හමුවී ඔහු දැනුවත් කර දෙමළ පොස්ටර් 800 පමණ බෙදා දුන් අතර දැන් ඒවා එම පළාතේ පාසල් වල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කෙරේ.
- උතුරු, වයඹ, සහ මධ්‍යම පලාත්හි සියලුම පොලිස් ස්ථානයන් (148) සඳහා සිංහල සහ දෙමළ පොස්ටර් 400 පමණ පලාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් හමුවී ඔවුන් දැනුවත් කරමින් ලබා දුන් අතර දැන් ඒවා එම පොලිස් ස්ථානයන් වල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කෙරේ.

- දිවයිනේ සියලුම රෝහල් පරිශ්‍රයන්හි දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අනුමැතියෙන් සිංහල පොස්ටර් 3000 සහ දෙමළ පොස්ටර් 1500 සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය වෙත ලබා දෙන ලදී.

## 6.3.6 - අධිකාරියේ වාර්ෂික වාර්තා සකස් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම:

- අධිකාරියේ 2018 සහා 2019 වාර්ෂික වාර්තා පිලියෙළ කර අධිකරණ අමාංශය හරහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර ඉන්පසු ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
- අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාව පිලියෙළ කර ඉන්පසු අධිකරණ අමාත්‍යාංශය හරහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී..

## 6.3.7- වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පිළිබඳව පර්යේෂණ සිදු කිරීම හා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම:

2021 වර්ෂයේදී පුස්ථකාල සහ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා පොත්පත් මිලදී ගැනීම සිදු කරන ලදී. අධිකාරියේ නිලධාරින් හට මෙම පොත්පත් පරිශීලනය සඳහා සුදුසු වැඩ පිලිවෙළක් සකස් කල අතර දැනටමත් නිලධාරීන් පොත්පත් පරිශීලනය කරමින් පවතී.

## 6.3.8 - අධිකාරිය සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීම:

අධිකාරිය සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් වෙබ් අඩවිය සදා නිම කර ඇත. මීට සමගාමීව අධිකාරියේ සියලුම නිලධාරින් සඳහා ආයතනික ඊමේල් සකසා ඇත.

## 6.3.9- වෙනත්:

- සංවර්ධනය සඳහා දායක වන නියෝජිතායතන (Donor Forum) වෙනුවෙන් යෝජනාවලිය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු විය.
- ට්‍රාන්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය අධිකාරිය සමග වැඩ කටයුතු කිරීමට ඉදිරිපත් කරන ලද යෝජනාවලිය කළමනාකරණ මන්ඩලය විසින් අනුමත කිරීම සහ එහි සඳහන් ක්‍රියකාරකම් කරගෙන යාම ආරම්භ කිරීම.
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමෙන්තුව සමග එකතුව දිවයිනේ අපරාධ අඩු කිරීමේ ක්‍රම සොයා බැලීම සඳහා දත්ත එක් රැස් කිරීම පිළිබඳව කථිකාවතක් සහ වින්දිතයන්ට මෙන්ම සාක්ෂිකරුවන්ට ඵලදායි ලෙස ආරක්ෂාව සහ සහාය සැපයිම පිළිබඳව පර්යේෂන පැවැත්වීම (පනතේ 13 වන වගන්ති ප්‍රකාරව) සම්බන්ධව කළමනාකරණ මන්ඩල සාමාජිකයින්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කිරීම සිදු විය.

- ඔස්ට්‍රේලියා මහ කොමසාරිස් කාර්යාලය හරහා Modern Slavery ආයතනය සමග සම්බන්ධතා පවත්වාගෙන යමින් ඔවුන් සමග සහසම්බන්ධ වී තැනැත්තන් වෙළඳාම (Trafficking in Person) පිළිබඳව වැඩ කටයුතු කිරීමට වාතාවරනය සකස් කරගැනීම සිදු විය.
- මිනිස් වෙළඳාම (TIP) නිසා වන වින්දිතයන් පිළිබඳව International Organization for Migration (IOM) ආයතනය සහ අධිකරණ අමාත්‍යාංශය සමග ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම-2021-2025 සඳහා තාක්ෂනික දායකත්වය ලබාදීම සහ IOM සමග සහසම්බන්ධ වී ඉදිරියේදී වැඩ කටයුතු කිරීම සඳහා වාතාවරනය සකස් කරගැනීම.
- කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කාන්තා, සාමය සහ ආරක්ෂාව ක්‍රියාකාරී සැලැස්ම 2022-2026 සඳහා දායකත්වය ලබාදීම.
- නව පත්වීම් ලද විනිසුරවරුන් 46 දෙනෙකු පනත පිළිබඳව දැනුවත් කිරීම අධිකාරියේ සභාපතිතුමා විසින් විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනයේදී දෙසැම්බර් මස 17 දින සිදු කරන ලදී. ඒ සඳහා පනත, සරළ විග්‍රහය සහ අත් පත්‍රිකා ඇතුලත්ව ගොනු (docket) ලබා දීමට කටයුතු කරන ලදී.

# 6.4 පාලන හා කළමනාකරණ අංශය

අධිකාරියේ කාර්යාලීය ක්‍රියාවලීන්ට අවශ්‍ය සහය නිරන්තරයෙන් සපයමින්, ආයතනයේ සේවාලාභීන්ට විශිෂ්ට සේවාවක් සැපයීම පාලන හා කලමනාකරණ අංශයේ මූලික කාර්යභාරය යි. අධිකාරියට අවශ්‍ය කරනා මානව, භෞතික සම්පත් සැපයීම සහ පරිපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ද, මෙම අංශයෙන් සිදු කෙරේ.

### 6.4.1- දේශිය / විදේශීය පුහුණු:

අදාළ කාලය තුළ විදේශය පුහුණු වැඩසටහන් සඳහා කිසිදු නිලධාරියෙක් සහභාගී නොවුණු අතර දේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට අවස්ථාව ලැබිණි. එය පහතින් දක්වා ඇත.

| පුහුණු වැඩසටහනේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ නිලධාරීන් | කාල සීමාව |
|---|---|---|---|
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | ජාතික ව්‍යාපාර අධ්‍යයන ආයතනය | කළමනාකරණ සහකාරවරුන් - 03 | මාස 12 |
| ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ පාඨමාලාව | | කළමනාකරණ සහකාරවරුන්-02 | මාස2 1/2 |
| LLB (Master) | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | සහකාර අධ්‍යක්ෂ - නීති | - |
| අභ්‍යන්තර විගණන පාඨමාලාව | ජාතික ශ්‍රම අධ්‍යාපන ආයතනය | කළමනාකරණ සහකාර - 01 | මාස 04 |

-වගුව 10-

- ✓ රටේ පවතින කොවිඩ් වසංගත තත්වය මත කාර්යමණ්ඩල සාමාජිකයින් පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීමට බාධා ඇති විය.

- ✓ 2021 වර්ෂයට අදාළ කාර්යමණ්ඩල බඳවා ගැනීමට අපේක්ෂිත නව කාර්යමණ්ඩලය සඳහා අනුස්ථාපන වැඩසටහන් පුහුණු වැඩටහන්ද සකස් කර ඇත.

## 6.4.2- ප්‍රසම්පාදන (ප්‍රසම්පාදන සැලැස්මට අනුව) :

| අයිතමය | වියදම් කළ මුදල | වෙනත් |
|---|---|---|
| අදාල කාර්යාලීය ලී බඩු මිළ දී ගැනීම. | 660,746.00 | - |
| ජාතික අධිකාරිය සඳහා රැකවරණ නිවසක් මිළ දී ගැනීම. | 20,000,000.00 | - |
| පුස්තකාලය සඳහා අවශ්‍ය පොත් මිළදී ගැනීම | 23,989.00 | - |
| වෙබ්අඩවිය | 367,416.00 | අවසන් ගෙවීම. |

-වගුව 11-

- ✓ පරිගණක මිළ දී ගැනීමට අදාළව දෙවරක් මිළ ගණන් කැඳවනු ලැබූවද පැවැති කොවිඩ් වසංගත තත්වය මත මිළදී ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත.

## 6.4.3- මානව සම්පත් කළමනාරණය:

- ✓ පවතින පුරප්පාඩු පිරවීම සඳහා 2020.12.06 දින පුවත්පත් දැන්වීම් පල කරන ලද අතර ඒ සඳහා ලැබුණු අයදුම්පත් මේවන විට කෙටි ලැයිස්තු ගත කර අවසන් අදියරේ පවතී.
- ✓ සන්නිවේදන නිලධාරී බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ 2021.04.29 සහ 30 දෙදින තුළ පැවැත්වීමට නියමිතව තිබුණද කොවිඩ් වසංගත තතවය මත අදාළ බඳවා ගැනීම් අවසන් කිරීමට නොහැකි වී ඇත.
- ✓ අධ්‍යක්ෂ (රැකවරණ) තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ පුවත්පත් දැන්වීම් (දෙවැනි වර) 2021.04.25 දින පල කරන ලදී. එහෙත් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකිව පවතී.
- ✓ සේවා කාලය අවුරුදු 03 සම්පූර්ණ කරන ලද කාර්යමණ්ඩල සාමාජිකයින් 19 දෙනෙකුගේ පත්වීම් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ස්ථිර කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
- ✓ 2021 ඔක්තෝබර් 15 දින වන විට ජාතික අධිකාරිය සඳහා අධ්‍යක්ෂ ජනරාල් වරයෙක් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

**කළමනාකරණ මණ්ඩල සහ අනෙකුත් රැස්වීම්**

- කළමනාකරණ මණ්ඩල රැස්වීම් - 14
- විගණන හා කළමනාකරණ රැස්වීම් - 01
- ගරු ඇමති තුමන් සහ ලේකම් තුමන් සමග රැස්වීම් - 04
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්ගේ රැස්වීම් - 05

# 6.5 මූල්‍ය අංශය

අධිකාරියේ මූල්‍ය අංශය, ආයතනයට අවශ්‍ය අරමුදල් ලබා ගැනීම, අරමුදල් කළමනාකරණය කිරීම සහ විවිධ වත්කම් සඳහා අරමුදල් වියදම් සැලසුම් කිරීමේ වගකීම දරයි. මූල්‍ය අංශය මඟින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස සියලු ක්‍රියාකාරකම්වලට සහාය වීම සඳහා වැදගත් වන කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය පාලනය තහවුරු කරයි.

### 6.5.1 - 2021/12/31 දිනට අදාල ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සාරාංශ වාර්තාව:

| වැය විෂය හා විස්තරය | 2021 අය වැය ඇස්තමේන්තුව (ජනවාරි - දෙසැම්බර්) (රු. ) | 2021.12.31 දිනට සංශෝධිත ඇස්තමේන්තුව (රු.) | 2021.12.31 දිනට වියදම (රු. ) | ඉතිරි වීම් / ඉක්මවීම (රු.) | ඉතිරි වීම (%) |
|---|---|---|---|---|---|
| 1503 (පුනරාවර්තන) | 50,000,000.00 | 45,000,000.00 | 42,861,133.00 | 2,138,867.00 | 4.75 % |
| 2201 (ප්‍රාග්ධන) | 40,000,000.00 | 32,000,000.00 | 22,365,005.00 | 9,634,995.00 | 30.00 % |

- වගුව 12-

### 6.5.2 - අධිකාරියේ ආරක්ෂණ අරමුදල:

2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 29 වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට එම අරමුදලට අදාල තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| 2021.01.01 දිනට ඉදිරියට ගෙන එන ලද ශේෂය | රු. 10,870,309.00 |
| 2021 වර්ෂය තුළ අරමුදලට එකතුවීම් | රු. 1,912,685.00 |
| 2021.12.31 දිනට ශේෂය | රු 12,782,994.00 |

-වගුව 13-

# 07.විගණන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනය

## NOTES TO THE FINANCIAL STATEMENTS FOR THE YEAR ENDED 31.12.2021

### ACCOUNTING POLICIES

### 1. CORPORATE INFORMATION

#### 1.1. Domicile and Legal Form

National Authority for the Protection of Victims of Crime & Witnesses established by Assistance to and Protection of Victims of Crime & Witnesses Act No. 04 of the year 2015 by the parliament of Democratic Socialist Republic of Sri Lanka and expanding its area of services further, under the Ministry of Justice. The head office is located at No. 428/11 A, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka.

#### 1.2 Principal Activities and Nature of Operations

With the aspect of achieving the objects of the Act, the duties and the functions of the Authority are enlisted under Section 13 of Assistance to and Protection of Victims of Crime & Witnesses Act No. 04 of 2015.

#### 1.3 The Number of Employees

The number of employees at the end of the year 2021 was 36.

### 2 BASIS OF PREPARATION

#### 2.1 Statement of Compliance.

The financial statements of National Authority for the Protection of Victims of Crime & Witnesses comprise the Statement of Financial Position, Statement of Financial Performance, Statement of Cash Flow, Statement of Changes in Equity and Notes to the Financial Statements and other explanatory information. These statements are prepared in accordance with the Sri Lanka Public Sector Accounting Standards (SLPSAs) laid down by the Institute of Chartered Accountants of Sri Lanka (ICASL).

#### 2.2. Basis of Measurement

The financial Statements have been prepared on the historical cost Basis.

No adjustments have been made for inflationary factors in the financial statements

#### 2.2 Functional and presentation Currency.

These financial Statements are presented in Sri Lankan Rupees, which is the National Authority for the Protection of Victims of Crime & Witnesses functional currency.

## 3 SIGNIFICANT ACCOUNTING POLICIES

These accounting policies set out bellow have been applied consistently to all periods presented in these financial statements.

### 3.1. Property, Plant and Equipment

The cost of Property, Plant and Equipment is the cost of acquisition or construction together with any expenses incurred in bringing the asset to its working condition for its intended use. Subsequent to the initial recognition as an asset at cost, revalued assets are carried at revalued amount less any subsequent deprecation thereon. All other Property, Plant and Equipment are stated at cost less accumulated depreciation. Where an item of Property, plant and equipments comprises major components having different useful lives, they are accounted for as separate item of Property, plant and equipments.

The asset's residual values, useful lives and methods of depreciation are reviewed, and adjusted if appropriate, at each financial year end.

**Property, Plant and Equipment- Received as Grant**

Property, Plant and Equipment acquired under any grant are capitalized at cost.

Property, Plant and Equipment other than freehold land are stated at cost less accumulated depreciation. Free hold land is stated at cost.

Depreciation is charged on all Property, Plant and Equipment other than freehold land to write off the cost over the estimated useful lives.

Depreciation has been provided for the year on pro-rata basis.

Property, Plant and Equipment are depreciated on straight line method as mentioned below, further, that the all Property, Plant and Equipment have been accounted at cost method as prescribe in the **SLPSAS 7 - Property, Plant & Equipment.**

| | | |
|---|---|---|
| 1. | Building | 4% |
| 2. | Computer & Accessories | 25% |
| 3. | Furniture & Office Equipment | 10% |
| 4. | Office Premises | 4% |
| 5. | Soft Ware | 25% |
| 6. | Others | 10%. |

An item of Property, Plant and Equipment is derecognized upon disposal or when no future economic benefit is expected from its use or disposal. Any gain or loss arising on de-recognition of the asset (Calculated as the difference between the net disposal proceeds and the carrying amount of the asset) is included in the income statement in the year the asset is derecognized.
Expenditure incurred on repairs or maintenance of Property, Plant and Equipment in order to restore or maintain future economic benefit expected from originally assessed standard of performance is recognized as an expense when incurred.

### 3.2 Inventories

The inventories used during the financial year had been charged to the income & expenditure statement at cost.

Balance stock has been valued at cost, selling price or net realizable value whichever is lower.

### 3.3. Cash and Cash equivalents

Cash and cash equivalents comprise cash in hand and held at bank.

### 3.4. Cash flow Statement

Cash flow Statement has been prepared using the indirect method.

### 3.5. Liabilities and Provisions

Liabilities are recognized in the balance sheet when there is a present obligation as a result of past events, the settlement of which is expected to result in an outflow of resources embodying economic benefits. Obligations payable at the demand of the creditors or within one year of the balance sheet date are treated as current liabilities in the Balance sheet.

Provision is recognized if, as a result of a past event, the National Authority for the Protection of Victims & Crime Witnesses has a present legal or constructive obligation that can be estimated reliably, and it is probable that an outflow of economic benefit will be required to settle the obligation.

### 3.6. Taxation

Tax expenses reported in the financial statement and computed in accordance with the provision of the Inland Revenue Act No.24 of 2017 and its amendments thereto.

### 3.7. Employee Benefits

**I. Define Contribution Plan.**

Obligation to define contribution plan are recognized as an expense in the income statement as incurred. National Authority for the Protection of Victims of Crime & Witnesses contributes 12% and 3% of gross emoluments of employees to Provident Fund and Trust Fund respectively.

**II. Define Benefit Plan**

Gratuity is a define benefit plan. National Authority for the Protection of Victims of Crime & Witnesses is liable to pay gratuity in terms of the relevant statute. In order to meet this liability, a provision is carried forward in the balance sheet, equivalent to an amount calculated base on a half month's salary of the last of the financial year of all employees for each completed year of service, commencing from the first year of service.

Provision is made for retirement gratuity for all employees in respect of gratuity payable under the payment of gratuity Act No. 12 of 1983. This item is grouped under non current liabilities in the balance sheet.

According to The Treasury, a fund is not necessary, as they will grant the funds when required.

**3.8. Funds of the Authority**

As per Section 18 and Section 29 of the Act, the Authority has two (2) Funds.

1. Fund of the Authority

   This fund should be credited
   -all such money as may be voted from time to time by Parliament for the use of the authority and
   -all such sums of money as may be received by the authority by way of donations, gifts, bequests, and grants from sources within or outside Sri Lanka.

   Expenditure incurred by the Authority in the exercise and performance of its duties and functions under the Act, shall be paid out of Fund of the authority.

2. Protection Fund

   There shall be paid into the Protection Fund
   -all such sums as may be voted by the parliament for such fund;
   -all such sums as may be received by the Authority to be remitted to the Protection Fund by the way of any gift, donation, contribution, bequest and grant from any local or foreign sources and
   -all such monies remitted by the Court under subsection (1) (a) (ii) of section 28.

   There shall be paid out of the Protection Fund as may be determined by the Board for the payments under subsection (4)(a) and (b) of section 29.

**3.9. Revenue Recognition**

**3.9.1 Revenue Recognition**

All such monies remitted by a Court under subsection (1) (a) (ii) of section 28 are accounted on receipt basis whilst interest and all other income are accounted on accrual basis.

### 3.9.2 Expenditure

All expenditure incurred in the running of the board has been accounted on accrual basis and all expenditure incurred in the acquisition, extension or improvement of assets of a permanent nature in order to carry on or increase the earning capacity of the Board has been treated as capital expenditure.

### 3.10. Comparative information

Where necessary, comparative figures have been rearranged to conform to the current year presentation.

### 3.11. Events occurring after balance sheet date

All material post balance sheet events have been considered and where appropriate adjustment or disclosures have been made in respective note to the financial statement.

### 3.12. Commitments and contingencies

